මහාසුදස්සනසුත්තං> දීඝනිකාය>මහාවග්ගො

බ්‍රහ්මලොකූපගමං

269

‘‘අථ ඛො, ආනන්ද, රාජා මහාසුදස්සනො නචිරස්සෙව කාලමකාසි. සෙය්‍යථාපි, ආනන්ද, ගහපතිස්ස වා ගහපතිපුත්තස්ස වා මනුඤ්ඤං භොජනං භුත්තාවිස්ස භත්තසම්මදො හොති, එවමෙව ඛො, ආනන්ද, රඤ්ඤො මහාසුදස්සනස්ස මාරණන්තිකා වෙදනා අහොසි. කාලඞ්කතො ච, ආනන්ද, රාජා මහාසුදස්සනො සුගතිං බ්‍රහ්මලොකං උපපජ්ජි. රාජා, ආනන්ද, මහාසුදස්සනො චතුරාසීති වස්සසහස්සානි කුමාරකීළං (කීළිතං (ක.), කීළිකං (සී. පී.)) කීළි. චතුරාසීති වස්සසහස්සානි ඔපරජ්ජං කාරෙසි. චතුරාසීති වස්සසහස්සානි රජ්ජං කාරෙසි. චතුරාසීති වස්සසහස්සානි ගිහිභූතො (ගිහීභූතො (සී. පී.)) ධම්මෙ පාසාදෙ බ්‍රහ්මචරියං චරි (බ්‍රහ්මචරියමචරි (ක.)). සො චත්තාරො බ්‍රහ්මවිහාරෙ භාවෙත්වා කායස්ස භෙදා පරං මරණා බ්‍රහ්මලොකූපගො අහොසි.

270

‘‘සියා ඛො පනානන්ද, එවමස්ස - ‘අඤ්ඤො නූන තෙන සමයෙන රාජා මහාසුදස්සනො අහොසී’ති, න ඛො පනෙතං, ආනන්ද, එවං දට්ඨබ්බං. අහං තෙන සමයෙන රාජා මහාසුදස්සනො අහොසිං. මම තානි චතුරාසීති නගරසහස්සානි කුසාවතීරාජධානිප්පමුඛානි, මම තානි චතුරාසීති පාසාදසහස්සානි ධම්මපාසාදප්පමුඛානි, මම තානි චතුරාසීති කූටාගාරසහස්සානි මහාබ්‍යූහකූටාගාරප්පමුඛානි, මම තානි චතුරාසීති පල්ලඞ්කසහස්සානි සොවණ්ණමයානි රූපියමයානි දන්තමයානි සාරමයානි ගොනකත්ථතානි පටිකත්ථතානි පටලිකත්ථතානි කදලිමිගපවරපච්චත්ථරණානි සඋත්තරච්ඡදානිඋභතොලොහිතකූපධානානි, මම තානි චතුරාසීති නාගසහස්සානි සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි උපොසථනාගරාජප්පමුඛානි, මම තානි චතුරාසීති අස්සසහස්සානි සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි වලාහකඅස්සරාජප්පමුඛානි, මම තානි චතුරාසීති රථසහස්සානි සීහචම්මපරිවාරානි බ්‍යග්ඝචම්මපරිවාරානි දීපිචම්මපරිවාරානි පණ්ඩුකම්බලපරිවාරානි සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණධජානි හෙමජාලපටිච්ඡන්නානි වෙජයන්තරථප්පමුඛානි, මම තානි චතුරාසීති මණිසහස්සානි මණිරතනප්පමුඛානි, මම තානි චතුරාසීති ඉත්ථිසහස්සානි සුභද්දාදෙවිප්පමුඛානි, මම තානි චතුරාසීති ගහපතිසහස්සානි ගහපතිරතනප්පමුඛානි, මම තානි චතුරාසීති ඛත්තියසහස්සානි අනුයන්තානි පරිණායකරතනප්පමුඛානි, මම තානි චතුරාසීති ධෙනුසහස්සානි දුහසන්දනානි කංසූපධාරණානි, මම තානි චතුරාසීති වත්ථකොටිසහස්සානි ඛොමසුඛුමානං කප්පාසිකසුඛුමානං කොසෙය්‍යසුඛුමානං කම්බලසුඛුමානං, මම තානි චතුරාසීති ථාලිපාකසහස්සානි සායං පාතං භත්තාභිහාරො අභිහරියිත්ථ.

271

‘‘තෙසං ඛො පනානන්ද, චතුරාසීතිනගරසහස්සානං එකඤ්ඤෙව තං නගරං හොති, යං තෙන සමයෙන අජ්ඣාවසාමි යදිදං කුසාවතී රාජධානී. තෙසං ඛො පනානන්ද, චතුරාසීතිපාසාදසහස්සානං එකොයෙව සො පාසාදො හොති, යං තෙන සමයෙන අජ්ඣාවසාමි යදිදං ධම්මො පාසාදො. තෙසං ඛො පනානන්ද, චතුරාසීතිකූටාගාරසහස්සානං එකඤ්ඤෙව තං කූටාගාරං හොති, යං තෙන සමයෙන අජ්ඣාවසාමි යදිදං මහාබ්‍යූහං කූටාගාරං. තෙසං ඛො පනානන්ද, චතුරාසීතිපල්ලඞ්කසහස්සානං එකොයෙව සො පල්ලඞ්කො හොති, යං තෙන සමයෙන පරිභුඤ්ජාමි යදිදං සොවණ්ණමයො වා රූපියමයො වා දන්තමයො වා සාරමයො වා. තෙසං ඛො පනානන්ද, චතුරාසීතිනාගසහස්සානං එකොයෙව සො නාගො හොති, යං තෙන සමයෙන අභිරුහාමි යදිදං උපොසථො නාගරාජා. තෙසං ඛො පනානන්ද, චතුරාසීතිඅස්සසහස්සානං එකොයෙව සො අස්සො හොති, යං තෙන සමයෙන අභිරුහාමි යදිදං වලාහකො අස්සරාජා. තෙසං ඛො පනානන්ද, චතුරාසීතිරථසහස්සානං එකොයෙව සො රථො හොති, යං තෙන සමයෙන අභිරුහාමි යදිදං වෙජයන්තරථො. තෙසං ඛො පනානන්ද, චතුරාසීතිඉත්ථිසහස්සානං එකායෙව සා ඉත්ථී හොති, යා තෙන සමයෙන පච්චුපට්ඨාති ඛත්තියානී වා වෙස්සිනී (වෙස්සායිනී (ස්‍යා.), වෙලාමිකානී (ක. සී. පී.) වෙලාමිකා (සං. නි. 3.96)) වා. තෙසං ඛො පනානන්ද, වා. තෙසං ඛො පනානන්ද, චතුරාසීතිවත්ථකොටිසහස්සානං එකංයෙව තං දුස්සයුගං හොති, යං තෙන සමයෙන පරිදහාමි ඛොමසුඛුමං වා කප්පාසිකසුඛුමං වා කොසෙය්‍යසුඛුමං වා කම්බලසුඛුමං වා. තෙසං ඛො පනානන්ද

- **නිබ්බින්දිත්වා.**පූ.ක්‍රි කිලකිරී.
-
- **අලං.**නි ඔය ඇති; ප්‍රමාණයි; යෝග්‍ය; සමර්ථ; සෑහේ.
- **අලං.**අ අලඞ්කාර, පර්‍ය්‍යාප්ති, ප්‍රතිෂෙධ, සුදුසු යන අර්ථයන්හි.
- **විරජ්ජිතුං.**නි නො ඇලෙන්ට.
- **විමුච්චිතුං.**නි මිදෙන්ට.
- **නාලං.**නි නො සෑහේ; ප්‍රමාණ නොවේ.

- නාලං.අ නුසුදුසු, නොසෑහෙන
-

චතුරාසීතිථාලිපාකසහස්සානං එකොයෙව සො ථාලිපාකො හොති, යතො නාළිකොදනපරමං භුඤ්ජාමි තදුපියඤ්ච සූපෙයාං.

272

‘‘පස්සානන්ද, සබ්බෙතෙ සඞ්ඛාරා අතීතා නිරුද්ධා විපරිණතා. එවං අනිච්චා ඛො, ආනන්ද, සඞ්ඛාරා; එවං අද්ධුවා ඛො, ආනන්ද, සඞ්ඛාරා; එවං අනස්සාසිකා ඛො, ආනන්ද, සඞ්ඛාරා! යාවඤ්චිදං, ආනන්ද , අලමෙව සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං, අලං විරජ්ජිතුං, අලං විමුච්චිතුං.

‘‘ඡක්ඛත්තුං ඛො පනාහං, ආනන්ද, අභිජානාමි ඉමස්මිං පදෙසෙ සරීරං නික්ඛිපිතං, තඤ්ච ඛො රාජාව සමානො චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියපත්තො සත්තරතනසමන්නාගතො, අයං සත්තමො සරීරනික්ඛෙපො. න ඛො පනාහං, ආනන්ද, තං පදෙසං සමනුපස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය යත්ථ තථාගතො අට්ඨමං සරීරං නික්ඛිපෙය්‍යා’’ති. ඉදමවොච භගවා, ඉදං වත්වාන සුගතො අථාපරං එතදවොච සත්ථා -

‘‘අනිච්චා වත සඞ්ඛාරා, උප්පාදවයධම්මිනො;
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති, තෙසං වූපසමො සුඛො’’ති.

බ්‍රහ්මලොකූපගමං

269

“එවිට ආනන්දය, මහාසුදර්ශන රජතෙම නොබෝ වේලාවකින්ම කාලක්‍රියා කළේය. ආනන්දය. යම්සේ මිහිරිවූ ආහාරයක් අනුභව කළාවූ ගෘහපතියෙකුට හෝ ගෘහපති පුත්‍රයෙකුට හෝ බත් මතය ඇතිවේද, එපරිද්දෙන්ම ආනන්දය, මහාසුදර්ශන රජහට මරණාන්තික වේදනාව ස්වල්පවිය. ආනන්දය, කාලක්‍රියාකළාවූ මහාසුදර්ශන රජතෙම මනා ගති ඇතිහෙයින් සුගති නම්වූ බ්‍රහ්මලොකයෙහි උපන්නේය. ආනන්දය, මහාසුදර්ශන රජතෙම අසූහාරදහසක් අවුරුදු කුමාර ක්‍රීඩා කෙළේය. අසූහාරදහසක් අවුරුදු යුවරජකම් කළේය. අසූහාරදහසක් අවුරුදු රජකම් කෙළේය. අසූහාර දහසක් අවුරුදු ගිහිව සිටියේම ධර්මප්‍රාසාදයෙහි බ්‍රහ්මචර්‍ය්‍යාව කෙළේය. ඒ රජතෙම සතර බ්‍රහ්ම විහරණ ධර්මයන් වඩා ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු බඹලොව උපන්නේය.

270

“ආනන්දය, ඒ කාලයෙහිදී ඒකාන්තයෙන් වෙන කෙනෙක් මහාසුදර්ශන රජවීයයි තොපට මෙබඳු සිතක් වන්නේද? ආනන්දය, ඒ කාරණය එසේ නොදත යුතුය, මම ඒ කාලයේදී මහාසුදර්ශන රජවීමියි වදාළසේක. මා සම්බන්ධව කුසාවතී රාජධානිය ප්‍රධාන කොට ඇති අසූහාර දහසක් නගරද, ධර්මප්‍රාසාදය ප්‍රධානකොට ඇති අසූහාරදහසක් ප්‍රාසාදයෝද, මහාව්‍යුහ කූටාගාරය ප්‍රධානකොට ඇති අසූහාර දහසක් කූටාගාරද, ස්වර්ණමයවූද රිදීමයවූද දන්තමයවූද සාරමයවූද එක් පිට හා දෙපිට ලොම් ඇති එලුලොම් මුවා ඇතිරිද, රත් වැඩකළ දික්දහවලු ඇතිරිද, කෙසෙල් මුවසමින් කළ ඇතිරියෙන්ද මතුයෙහි බඳනාලද රත් වියන් සහිතවූ අසූහාරදහසක් ආසනද රත්රනින් අලංකාරවූ රත්රන් ධජ ඇත්තාවූ රත්රන් දැලෙන් වසනලද උපොසථ ඇත්රජ ප්‍රධාන කොට ඇති අසූහාර දහසක් ඇත්තුද, රත්රන් අලංකාර ඇත් රත්රන් ධජ ඇති රන් දැලින් වසනලද වළාහක අශ්ව රාජයා ප්‍රධානකොට ඇති අසූහාර දහසක් අශ්වයෝද, සිංහ සමින් වෙළන ලද්දාවූද ව්‍යාඝ්‍ර සමින් වෙළන ලද්දාවූද, දිවිසමින් වසන ලද්දාවූද රත් කම්බල වස්ත්‍රයෙන් වසනලද්දාවූද අසූහාර දහසක් රථද, මාණිකා්‍ය රත්නය ප්‍රධානකොට ඇති අසූහාරදාහක් මාණිකා්‍යද, සුභද්‍රාදේවී ප්‍රධාන අසූහාරදහසක් ස්ත්‍රීහුද, ගෘහපති රත්නය ප්‍රධාන අසූ හාරදහසක් ගෘහපතීහුද, පරිනායක රත්නය ප්‍රධාන අනුව හැසිරෙන්නාවූ අසූහාරදහසක් ක්ෂත්‍රියයෝද, එල්බෙන කිරි බුරුළු ඇත්තාවූ රත්රන් සැට්ට දරන්නාවූ අසූහාරදහසක් ගවදෙන්නුද වූහ. සියුම්වූ කොමු පිළිද, සියුම්වූ කපු පිළිද, කොසෙයා්‍ය පිළිද යන මේ වස්ත්‍ර කෝටි අසූහාරදහසක්ද සවස උදය ආහාර පිණිස එළවනලද සූවාසූදහසක් බත් තලිද මා සම්බන්ධ වූවාහුමය.

271

“ආනන්දය, ඒ අසූහාර දහසක් නගර අතුරෙන් යම් කුසාවතී රාජධානියෙක්විද එසමයෙහි ඒ එකම කුසාවතී නුවර වාසයකෙළෙමි. ආනන්දය, ඒ අසූහාරදහසක්ප්‍රාසාදයන් අතුරෙන් යම් ඒ ධර්මප්‍රාසාදයක් වූයේද ඒ එකම ධර්ම ප්‍රාසාදයෙහි වාසය කෙළෙමි. ආනන්දය, ඒ අසූහාරදහසක් කූටාගාරයන් අතුරෙන් යම් ඒ ‘මහාව්‍යුහ’ නම් කූටාගාරයෙක් වූයේද

එසමයෙහි ඒ එකම මහාවියූහ නම් කූටාගාරයෙහි වාසය කෙළෙමි. ආනන්දය, ඒ සුවාසූදහසක් ආසන අතුරෙන් යම් ඒ රත්රන්වූ හෝ රිදීවූ හෝ දන්තමයවූ හෝ සාරමයවූ හෝ ආසනයක් වූයේද, ඒ එකම ආසනයක හිඳගත්තෙමි. ආනන්දය, ඒ අසූහාරදහසක් ඇතුන් අතුරෙන් යම් උපොසථ හස්ති රාජයෙක් වීද, එසමයෙහි ඔහුම වාහණයකොට ගත් තෙමි. ආනන්දය, ඒ අසූහාරදහසක් අශ්වයන් අතුරෙන් යම් ඒ වළාහක අශ්වරාජයෙක් වූයේද එසමයෙහි ඔහුම වාහණයකොට ගත්තෙමි. ආනන්දය, ඒ අසූහාරදහසක් රථයන් අතුරෙන් යම් ඒ වෛජයන්ත නම් රථයක් වූයේද එසමයෙහි ඒ රථයම වාහණයකොට ගත්තෙමි. ආනන්දය, ඒ අසූහාර දහසක් ස්ත්‍රීන් අතුරෙන් ක්ෂත්‍රියවූ හෝ වෛශ්‍යාවූ හෝ යම් එකම ස්ත්‍රියක් මට උපස්ථායිනීව සිටියාය. ආනන්දය, සියුම් කොමු පිළිවූ හෝ සියුම් කපු පිළිවූ හෝ සියුම් කෝසෙය්‍ය වස්ත්‍රවූ හෝ සියුම් කම්බල වස්ත්‍රවූ හෝ යම් ඒ වස්ත්‍ර කෝටි අසූහාරදහසක් වූයේද එයින් වස්ත්‍ර දෙකක් පමණක් හැන්දෙමි. ආනන්දය, ඒ අසූහාරදහසක් බත් තලි අතුරෙන් යම් ඒ එක් බත් තලියක් වේද එයින් නැළියක් පමණ බත් ඊට ප්‍රමාණ සූපව්‍යඤ්ජන සහිතව අනුභව කෙළෙමි.

272

"ආනන්දය, සංස්කාරයන්ගේ අනිත්‍යතාව බලව, සියලුම ඒ සංස්කාර ධර්මයෝ ඉකුත්වූහ. නිරුද්ධවූහ, විනාශ වූහ. ආනන්දය, මෙසේ සංස්කාරයෝ අනිත්‍ය වන්නාහුය. ආනන්දය, සංස්කාරයෝ මෙසේ අස්ථිර වන්නාහුය. ආනන්දය, සංස්කාරයෝ මෙසේ අස්වැසීමක් නැත්තාහුමය. ආනන්දය, යම් මේ සියලු සංස්කාර ධර්මයන් කෙරෙහි කලකිරෙන්ට සුදුසු වන්නේය. නොඇලෙන්නට සුදුසු වන්නේමය. මිදෙන්ට සුදුසු වන්නේමය.

ආනන්දය, මම වනාහි මේ ප්‍රදෙශයෙහි හය වාරයක්ම ශරීර නික්ෂෙපය (ශරීරය දැමීම) කළ බව දනිමි. ඒ වනාහි ධාර්මිකවූ ධර්මරාජන්වූ චක්‍රවාළය කෙළවරකොට ඇති සතර මහාද්වීපය ජයගත්තාවූ ජනපදයන්හි ස්ථිර භාවයට පැමිණියාවූ සප්තවිධ රත්නයෙන් යුක්තවූ සක්විති රජ කාලයන්හිමය. මේ සත්වෙනි සරීර නික්ෂෙපය (ශරීරය දැමීම) වන්නේය. ආනන්දය, දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ ශ්‍රමණබ්‍රාහ්මණයන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ ලෝකයෙහි යම් තැනෙක්හි තථාගත තෙම අටවැනිවර ශරීර නික්ෂෙපය කරන්නේද එබඳුවූ ප්‍රදෙශයක් මම නොදක්නෙමියි වදාළසේක. භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය මෙසේ වදාරා එයින් මත්තෙහි සුගත නම්වූ ශාස්තෲන් වහන්සේ මෙසේද වදාළසේක.

"ඉපිද නැසෙන සුලුවූ සංස්කාර ධර්මයෝ ඒකාන්තයෙන් අනිත්‍යයහ. ඉපිද නැති වෙත්. ඔවුන්ගේ සංසිඳීම සැප වන්නේය" යනුයි.

දහහත්වෙනි මහාසුදර්ශන සූත්‍රය නිමියේය.

3. අස්සුසුත්තං

සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං, අලං විරජ්ජිතුං, අලං විමුච්චිතු''න්ති.තතියං .

සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය.ඔවුන්ගෙන් මිදීමට සුදුසුමය .නො ඇලීමට සුදුසුමය ."

2. උපට්ඨානසුත්තං

222

එකං සමයං අඤ්ඤතරො භික්ඛු කොසලෙසු විහරති අඤ්ඤතරස්මිං වනසණ්ඩෙ. තෙන ඛො පන සමයෙන සො භික්ඛු දිවාවිහාරගතො සුපති. අථ ඛො යා තස්මිං වනසණ්ඩෙ අධිවත්ථා දෙවතා තස්ස භික්ඛුනො අනුකම්පිකා අත්ථකාමා තං භික්ඛුං සංවෙජෙතුකාමා යෙන සො භික්ඛු තෙනුපසඞ්කමි; උපසඞ්කමිත්වා තං භික්ඛුං ගාථාහි අජ්ඣභාසි -

''උට්ඨෙහි භික්ඛු කිං සෙසි, කො අත්ථො සුපිතෙන (සුපිනෙන (සී.)) තෙ;
ආතුරස්ස හි කා නිද්දා, සල්ලවිද්ධස්ස රුප්පතො.

''යාය සද්ධාය පබ්බජිතො (යාය සද්ධාපබ්බජිතො (සී. ස්‍යා. කං.)), අගාරස්මානගාරියං;
තමෙව සද්ධං බ්‍රූහෙහි, මා නිද්දාය වසං ගමී''ති.

''අනිච්චා අද්ධුවා කාමා, යෙසු මන්දොව මුච්ඡිතො;
බද්ධෙසු (බන්ධෙසු (සී.)) මුත්තං අසිතං, කස්මා පබ්බජිතං තපෙ.

‘‘ඡන්දරාගස්ස විනයා, අවිජ්ජාසමතික්කමා;
තං ඤාණං පරමොදානං (පරියොදාතං (සී. පී.), පරමොදාතං (සයා. කං.), පරමවොදානං (සී. අට්ඨ.)), කස්මා පබ්බජිතං තපෙ.

‘‘ඡෙත්වා (භෙත්වා (සී. සයා. කං. පී.)) අවිජ්ජං විජ්ජාය, ආසවානං පරික්ඛයා;
අසොකං අනුපායාසං, කස්මා පබ්බජිතං තපෙ.

2. උපට්ඨාන සූත්‍රය

උපට්ඨානසුත්තං> සංයුත්තනිකායොසගාථවග්ගො> වනසංයුත්තං> වනවග්ගො

222

මා විසින් මෙසේ අසනලදී. එක්කලෙක එක්තරා භික්ෂුවක් කොසොල් රට එක්තරා වනලැහැබෙක වෙසෙයි.
එකල වනාහි ඒ භික්ෂුව දහවල් විවේකයට ගියේ නිදයි. ඉක්බිති ඒ වනලැහැබෙහි අරක්ගත් යම් දේවතාවෙක් වූයේද, හෙතෙම ඒ භික්ෂුවට අනුකම්පා සහිතවූයේ, හිත කැමැත්තේ, ඒ භික්ෂුව උනන්දු කරනු කැමැත්තේ, ඒ භික්ෂුව යම් තැනෙකද එතැනට පැමිණියේය.
පැමිණ, ඒ භික්ෂුවට ගාථායෙන් (මෙසේ) කීය:
''මහණ, නැගිටුව, කිම නිදන්නෙහි ද? නින්දෙන් තට කිනම් ප්‍රයෝජනයෙක් ද? ක්ලේශාතුරවූ, තෘෂ්ණා නමැති හුලින් හෘදය විදින ලද්දාවූ, වෙහෙසෙන්නාවූ, යුෂ්මත්හුට කවර නින්දක් ද?
''යම් බඳු ශ්‍රද්ධායෙකින් ගිහිගෙයින් නික්ම ශාසනයෙහි පැවිදි වූයෙහි ද, ඒ ශ්‍රද්ධාවම වඩා නින්දට වසඟ නොවව.''
''යම් කාමයන්හි නුවණ මඳ වූ පෘතග්ජන තෙමේ මුසපත් වූයේ ද, එම කාමයෝ අනිත්‍යයෝය. නස්නා සුලුයහ. බන්ධනයන් කෙරෙන් මිදුනාවූ, තණ්හාවෙන් නොබැඳුනාවූ, ආශාවයන් නැතිකළ (රහත්) පැවිද්දෙකු (වූ මා) කවර හෙයකින් තවන්නේ ද?
''ඡන්‍දරාගය වැනසීම නිසාද, අවිද්‍යාව ඉක්මවූ බැවින්ද, ඒ ඥානය අතිශයින් පිරිසිදුය, (එබඳු නුවණැති) පැවිද්දකු කවර හෙයකින් තවන්නේ ද?
''විද්‍යායෙන් අවිද්‍යාව බිඳ, (කාමාදී) ආශ්‍රවයන් ක්‍ෂය කිරීම් හේතුවෙන් ශෝක නැත්තා වූ, උපායාස (තද ශෝක) නැත්තාවූ පැවිද්දකු කවර හෙයකින් (නිදිව) තවන්නේ ද? (නොතවන්නේමය.)
''සම්පූර්ණ වීර්‍ය්‍ය ඇති, නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති, දැඩි පරාක්‍රමයෙන් යුත්, නිවන් පතන්නාවූ පැවිද්දකු කවර හෙයකින් නිදීම තවන්නේ ද?''

10. වෙපුල්ලපබ්බතසුත්තං

වේපුල්ලපබ්බත සූත්‍රය> සංයුත්ත නිකාය>නිදාන වර්‍ගය> අනමතග්ග සංයුත්තය> දුග්ගත වර්‍ගය

143

එකං සමයං භගවා රාජගහෙ විහරති ගිජ්ඣකූටෙ පබ්බතෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි - ‘‘භික්ඛවො’’ති. ‘‘භදන්තෙ’’ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච -
‘‘අනමතග්ගොයං, භික්ඛවෙ, සංසාරො. පුබ්බා කොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං සන්ධාවතං සංසරතං. භූතපුබ්බං, භික්ඛවෙ, ඉමස්ස වෙපුල්ලස්ස පබ්බතස්ස ‘පාචීනවංසො’ත්වෙව සමඤ්ඤා උදපාදි. තෙන ඛො පන, භික්ඛවෙ , සමයෙන මනුස්සානං ‘තිවරා’ත්වෙව සමඤ්ඤා උදපාදි. තිවරානං, භික්ඛවෙ, මනුස්සානං චත්තාරීස වස්සසහස්සානි ආයුප්පමාණං අහොසි. තිවරා, භික්ඛවෙ, මනුස්සා පාචීනවංසං පබ්බතං චතුහෙන ආරොහන්ති, චතුහෙන ඔරොහන්ති. තෙන ඛො පන, භික්ඛවෙ , සමයෙන කකුසන්ධො භගවා අරහං සම්මාසම්බුද්ධො ලොකෙ උප්පන්නො හොති. කකුසන්ධස්ස, භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස විධුරසඤ්ජීවං නාම සාවකයුගං අහොසි අග්ගං භද්දයුගං. පස්සථ, භික්ඛවෙ, සා චෙවිමස්ස පබ්බතස්ස සමඤ්ඤා අන්තරහිතා, තෙ ච මනුස්සා කාලඞ්කතා, සො ච භගවා පරිනිබ්බුතො. එවං අනිච්චා, භික්ඛවෙ, සඞ්ඛාරා; එවං අද්ධුවා, භික්ඛවෙ, සඞ්ඛාරා; එවං අනස්සාසිකා, භික්ඛවෙ, සඞ්ඛාරා. යාවඤ්චිදං, භික්ඛවෙ, අලමෙව සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං, අලං විරජ්ජිතුං, අලං විමුච්චිතුං.
‘‘භූතපුබ්බං , භික්ඛවෙ, ඉමස්ස වෙපුල්ලස්ස පබ්බතස්ස ‘වඞ්කකො’ත්වෙව සමඤ්ඤා උදපාදි. තෙන ඛො පන, භික්ඛවෙ, සමයෙන මනුස්සානං ‘රොහිතස්සා’ත්වෙව සමඤ්ඤා උදපාදි. රොහිතස්සානං, භික්ඛවෙ, මනුස්සානං තිංසවස්සසහස්සානි ආයුප්පමාණං අහොසි. රොහිතස්සා, භික්ඛවෙ, මනුස්සා වඞ්කකං පබ්බතං තීහෙන ආරොහන්ති, තීහෙන ඔරොහන්ති. තෙන ඛො පන, භික්ඛවෙ, සමයෙන කොණාගමනො භගවා අරහං සම්මාසම්බුද්ධො ලොකෙ උප්පන්නො හොති. කොණාගමනස්ස, භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස භියොසුත්තරං නාම

සාවකයුගං අහොසි අග්ගං භද්දයුගං. පස්සථ, භික්ඛවෙ, සා චෙවිමස්ස පබ්බතස්ස සමඤ්ඤා අන්තරහිතා, තෙ ච මනුස්සා කාලඞ්කතා, සො ච භගවා පරිනිබ්බුතො. එවං අනිච්චා, භික්ඛවෙ, සඞ්ඛාරා...පෙ.... අලං විමුච්චිතුං.

‘‘භූතපුබ්බං, භික්ඛවෙ, ඉමස්ස වෙපුල්ලස්ස පබ්බතස්ස ‘සුපස්සො’ත්වෙව (සුඵස්සොත්වෙව (සී.))සමඤ්ඤා උදපාදි. තෙන ඛො පන, භික්ඛවෙ, සමයෙන මනුස්සානං ‘සුප්පියා’ත්වෙව (අප්පියාත්වෙව (සී.))සමඤ්ඤා උදපාදි. සුප්පියානං, භික්ඛවෙ, මනුස්සානං වීසතිවස්සසහස්සානි ආයුප්පමාණං අහොසි. සුප්පියා, භික්ඛවෙ, මනුස්සා සුපස්සං පබ්බතං ද්වීහෙන ආරොහන්ති, ද්වීහෙන ඔරොහන්ති. තෙන ඛො පන, භික්ඛවෙ, සමයෙන කස්සපො භගවා අරහං සම්මාසම්බුද්ධො ලොකෙ උප්පන්නො හොති. කස්සපස්ස, භික්ඛවෙ, භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස තිස්සභාරද්වාජං නාම සාවකයුගං අහොසි අග්ගං භද්දයුගං. පස්සථ, භික්ඛවෙ, සා චෙවිමස්ස පබ්බතස්ස සමඤ්ඤා අන්තරහිතා, තෙ ච මනුස්සා කාලඞ්කතා, සො ච භගවා පරිනිබ්බුතො. එවං අනිච්චා , භික්ඛවෙ, සඞ්ඛාරා; එවං අද්ධුවා, භික්ඛවෙ, සඞ්ඛාරා...පෙ.... අලං විමුච්චිතුං.

‘‘එතරහි ඛො පන, භික්ඛවෙ, ඉමස්ස වෙපුල්ලස්ස පබ්බතස්ස ‘වෙපුල්ලො’ත්වෙව සමඤ්ඤා උදපාදි. එතරහි ඛො පන, භික්ඛවෙ, ඉමෙසං මනුස්සානං ‘මාගධකා’ත්වෙව සමඤ්ඤා උදපාදි. මාගධකානං, භික්ඛවෙ, මනුස්සානං අප්පකං ආයුප්පමාණං පරිත්තං ලහුකං (ලහුසං (සී.)); යො චිරං ජීවති සො වස්සසතං අප්පං වා භියොයා. මාගධකා, භික්ඛවෙ, මනුස්සා වෙපුල්ලං පබ්බතං මුහුත්තෙන ආරොහන්ති මුහුත්තෙන ඔරොහන්ති. එතරහි ඛො පනාහං, භික්ඛවෙ, අරහං සම්මාසම්බුද්ධො ලොකෙ උප්පන්නො. මය්හං ඛො පන, භික්ඛවෙ, සාරිපුත්තමොග්ගල්ලානං නාම සාවකයුගං අග්ගං භද්දයුගං. භවිස්සති, භික්ඛවෙ, සො සමයො යා අයඤ්චෙවිමස්ස පබ්බතස්ස සමඤ්ඤා අන්තරධායිස්සති, ඉමෙ ච මනුස්සා කාලං කරිස්සන්ති, අහඤ්ච පරිනිබ්බායිස්සාමි. එවං අනිච්චා, භික්ඛවෙ, සඞ්ඛාරා; එවං අද්ධුවා, භික්ඛවෙ, සඞ්ඛාරා; එවං අනස්සාසිකා, භික්ඛවෙ, සඞ්ඛාරා. යාවඤ්චිදං, භික්ඛවෙ, අලමෙව සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං, අලං විරජ්ජිතුං, අලං විමුච්චිතු’’න්ති.

ඉදමවොච භගවා. ඉදං වත්වාන සුගතො අථාපරං එතදවොච සත්ථා -

‘‘පාචීනවංසො තිවරානං, රොහිතස්සාන වඞ්කකො;
සුප්පියානං සුපස්සොති, මාගධානඤ්ච වෙපුල්ලො.

‘‘අනිච්චා වත සඞ්ඛාරා, උප්පාදවයධම්මිනො;
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති, තෙසං වූපසමො සුඛො’’ති. දසමං;

10. වේපුල්ල සූත්‍රය

වේපුල්ලපබ්බත සූත්‍රය> සංයුත්ත නිකාය>නිදාන වර්‍ගය> අනමතග්ග සංයුත්තය> දුග්ගත වර්‍ගය

143

මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ “ගිජ්ඣකූට” පර්වතයෙහි වාසය කරනසේක. එහිදී වනාහි භාග්‍යවතුන් වහන්සේ ‘මහණෙනි’යි කියා භික්ෂූන්හට කථාකළ සේක. ‘ස්වාමීනි’ කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළ සේක.

“මහණෙනි, අවිජ්ජාවෙන් වැසී, තණ්හාවෙන් බැඳී, ගමන් කරන්නාවූ, සැරිසරන්නාවූ, සත්වයන්ගේ මේ සංසාරය නොදක්නා ලද අග ඇත්තේය. මුල් කොනත් නොපෙනෙන්නේය. මහණෙනි, පෙරවූවක් කියමි. එනම්:- මේ “වේපුල්ල” පර්වතයට “පාචීන වංස” යන නාමයක් ඇතිවිය. මහණෙනි, ඒ කාලයෙහි වනාහි මෙහි මිනිසුන්ට “තිවර” යන නාමය ඇතිවිය. මහණෙනි, “තිවර” මිනිසුන්ගේ ආයුෂ ප්‍රමාණය අවුරුදු හතළිස් දහසක්වූයේය. මහණෙනි, “තිවර” නම් ඒ මිනිස්සු “පාචීන වංස” නම් පර්වතයට සිව් දිනකින් නගිති. සිව් දිනකින් බසිති.

“මහණෙනි, ඒ කාලයෙහි වනාහි භාග්‍යවත්වූ, අර්හත්වූ “කකුසඳ” නම් සම්මාසම්බුදු රජාණන් වහන්සේ ලෝකයෙහි උපන් සේක. මහණෙනි, භාග්‍යවත්වූ, අර්හත්වූ “කකුසඳ” සම්මා සම්බුදු රජාණන් වහන්සේට “විධූරය” “සඤ්ජීවය” යන අග්‍රවූ, භද්‍රවූ, ශ්‍රාවක දෙනමක් වූයේය. මහණෙනි, බලව් මේ පර්වතයාගේ ඒ නාමයද අතුරුදන් විය. ඒ මිනිස්සුද කාලක්‍රියා කළාහුය. ඒ භාග්‍යවතුන් වහන්සේද පිරිනිවන් පෑ සේක. මහණෙනි, සංස්කාරයෝ මෙසේ අනිත්‍යයහ. මහණෙනි, සංස්කාරයෝ මෙසේ අස්ථිරයහ. මහණෙනි, සංස්කාරයෝ මෙසේ සැනසීම් රහිතයහ. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නො ඇලීමට සුදුසුමය. ඔවුන් කෙරෙන් මිදීමට සුදුසුමය.

“මහණෙනි, පෙරවූවක් කියමි. එනම්:- මේ “වේපුල්ල” පර්වතයට “වංකක” යන නාමය ඇතිවිය. මහණෙනි, ඒ කාලයෙහි වනාහි මෙහි මිනිසුන්ට “රෝහිතස්ස” යන නාමය ඇතිවිය. මහණෙනි, “රෝහිතස්ස” නම් මිනිසුන්ගේ ආයුෂ ප්‍රමාණය අවුරුදු තිස් දහසක් වූයේය. මහණෙනි, “රෝහිතස්ස” නම් මිනිස්සු “වංකක” නම් පර්වතයට තෙදිනකින් නගිති. තෙදිනකින් බසිති.

“මහණෙනි, ඒ කාලයෙහි වනාහි, භාග්‍යවත්වූ අර්හත්වූ, “කෝනාගමන” නම් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලෝකයෙහි උපන්සේක. මහණෙනි, භාග්‍යවත්වූ, අර්හත්වූ “කෝනාගමන” නම් සම්මාසම්බුදු රජාණන් වහන්සේට

“භියාය”, “සුත්තරය” යන අග්‍රවූ, භද්‍රවූ, ශ්‍රාවක දෙනමක් වූයේය. මහණෙනි, බලව් මේ පර්වතයාගේ ඒ නාමයද අතුරුදන් වීය. ඒ මිනිස්සුද කාලක්‍රියා කළාහුය. ඒ භාග්‍යවතුන් වහන්සේද පිරිනිවන් පෑ සේක. මහණෙනි, සංස්කාරයෝ මෙසේ අනිත්‍යයහ. මහණෙනි, සංස්කාරයෝ මෙසේ අස්ථිරයහ. මහණෙනි, සංස්කාරයෝ මෙසේ සැනසීම් රහිතය. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නො ඇලීමට සුදුසුමය. ඔවුන් කෙරෙන් මිදීමට සුදුසුමය.

“මහණෙනි, පෙරවූවක් කියමි. එනම්:- මේ “වේපුල්ල” පර්වතයට “සුඵස්ස” යන නාමය ඇතිවිය. මහණෙනි, ඒ කාලයෙහි වනාහි මේ මිනිසුන්ට “අප්පිය” යන නාමය ඇතිවිය. මහණෙනි, ‘අප්පිය’ නම් මිනිසුන්ගේ ආයුෂ ප්‍රමාණය අවුරුදු විසිදහසක් වූයේය. මහණෙනි, “අප්පිය” නම් මිනිස්සු “සුඵස්ස” නම් පර්වතයට දෙදිනකින් නගිති. දෙදිනකින් බසිති.

“මහණෙනි, ඒ කාලයෙහි වනාහි, භාග්‍යවත්වූ, අර්හත්වූ “කස්සප” නම් සම්මා සම්බුදු රජාණන් වහන්සේ ලෝකයෙහි උපන්සේක. මහණෙනි, භාග්‍යවත්වූ, අර්හත්වූ, “කස්සප” නම් සම්මා සම්බුදුරජාණන් වහන්සේට තිස්සය, භාරද්වාජය යන අග්‍රවූ භද්‍රවූ, ශ්‍රාවක දෙනමක් වූයේය. මහණෙනි, බලව් මේ පර්වතයාගේ ඒ නාමයද අතුරුදන් විය. ඒ මිනිස්සුද කාලක්‍රියා කළාහුය. ඒ භාග්‍යවතුන් වහන්සේද පිරිනිවන් පෑ සේක, මහණෙනි, සංස්කාරයෝ මෙසේ අනිත්‍යයහ. මහණෙනි, සංස්කාරයෝ මෙසේ අස්ථිරයහ. මහණෙනි, සංස්කාරයෝ මෙසේ සැනසීම් රහිතයහ. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නො ඇලීමට සුදුසුමය. ඔවුන් කෙරෙන් මිදීමට සුදුසුමය.

“මහණෙනි, මේ කාලයෙහි වනාහි මේ “වේපුල්ල” පර්වතයට “වේපුල්ල” පර්වතයයි කියාම නාමය ඇතිවිය. මහණෙනි, මේ කාලයෙහි මෙහි මිනිසුන්ට “මාගධක” යන නාමය ඇතිවිය. මහණෙනි, මෙකල මිනිසුන්ගේ ආයුෂ ප්‍රමාණය අල්පය. ස්වල්පය, ටිකය. යමෙක් බොහෝ කාලයක් ජීවත්වේ නම් හෙතෙම අවුරුදු සියයක් හෝ ඊට ස්වල්පයක් වැඩිය හෝ ජීවත් වෙයි. මහණෙනි, “මාගධක” නම් මිනිස්සු “වේපුල්ල” නම් පර්වතයට මොහොතකින් නගිති. මොහොතකින් බසිති.”

“මහණෙනි, මේ කාලයෙහි වනාහි භාග්‍යවත්වූ අර්හත්වූ, සම්‍යක්සම්බුද්ධවූ මම ලෝකයෙහි උපන්නේ වෙමි. මහණෙනි, මට වනාහි “සාරිපුත්තය, මොග්ගල්ලානය” යන අග්‍රවූ, භද්‍රවූ, ශ්‍රාවක දෙනමක් වන්නේය, මහණෙනි, මේ ඒ කාලයයි. මේ පර්වතයාගේ මේ නමද අතුරුදහන් වන්නේය. මේ මිනිස්සුද කාලක්‍රියා කරන්නාහුය. මමද පිරිනිවන් පාන්නෙමි. මහණෙනි, සංස්කාරයෝ මෙසේ අනිත්‍යයහ. මහණෙනි, සංස්කාරයෝ මෙසේ අස්ථිරයහ. මහණෙනි, සංස්කාරයෝ මෙසේ සැනසීම් රහිතයහ. මහණෙනි, මේ සියලු සංස්කාරයන් කෙරෙහි කලකිරීමට සුදුසුමය. නො ඇලීමට සුදුසුමය. ඔවුන් කෙරෙන් මිදීමට සුදුසුමය. භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනා කළ සේක. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාරා, අනතුරුව මේ ගාථාවන් දේශනාකළ සේක.

“තිවරයන්හට පාචීනවංස නම් පර්වතය විය. රොහිතස්සයන්ට වංකක නම් පර්වතය විය. අප්පියයන්හට සුඵස්ස නම් පර්වතය විය. මාගධකයන්හට වේපුල්ල නම් පර්වතය විය.”

“සංස්කාරයෝ ඒකාන්තයෙන් අනිත්‍යයහ. ඉපදීම හා බිඳීම ස්වභාව කොට ඇත්තාහ. ඉපද නිරුද්ධ වෙත්. ඔවුන්ගේ සංසිඳීම සැප වන්නේය.

(දසවෙනි වේපුල්ල සූත්‍රය නිමි.)

4. ගොමයපිණ්ඩසුත්තං

ගොමය පිණ්ඩූපම සුත්තං >සංයුත්තනිකායො>ඛන්ධකවග්ගො> ඛන්ධසංයුත්තං> මජ්ඣිමපණ්ණාසකො> පුප්ඵවග්ගො

96

සාවත්ථිනිදානං . එකමන්තං නිසින්නො ඛො සො භික්ඛු භගවන්තං එතදවොච - ‘‘අත්ථි නු ඛො, භන්තෙ, කිඤ්චි රූපං යං රූපං නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මං සස්සතිසමං තථෙව ඨස්සති? අත්ථි නු ඛො, භන්තෙ, කාචි වෙදනා යා වෙදනා නිච්චා ධුවා සස්සතා අවිපරිණාමධම්මා සස්සතිසමං තථෙව ඨස්සති? අත්ථි නු ඛො, භන්තෙ, කාචි සඤ්ඤා යා සඤ්ඤා...පෙ.... අත්ථි නු ඛො, භන්තෙ, කෙචි සඞ්ඛාරා යෙ සඞ්ඛාරා නිච්චා ධුවා සස්සතා අවිපරිණාමධම්මා සස්සතිසමං තථෙව ඨස්සන්ති? අත්ථි නු ඛො, භන්තෙ, කිඤ්චි විඤ්ඤාණං, යං විඤ්ඤාණං නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මං සස්සතිසමං තථෙව ඨස්සතී’’ති? ‘‘නත්ථි ඛො, භික්ඛු, කිඤ්චි රූපං, යං රූපං නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මං සස්සතිසමං තථෙව ඨස්සති. නත්ථි ඛො, භික්ඛු, කාචි වෙදනා... කාචි සඤ්ඤා... කෙචි සඞ්ඛාරා... කිඤ්චි විඤ්ඤාණං , යං විඤ්ඤාණං නිච්චං ධුවං සස්සතං අවිපරිණාමධම්මං සස්සතිසමං තථෙව ඨස්සතී’’ති.

අථ ඛො භගවා පරිත්තං ගොමයපිණ්ඩං පාණිනා ගහෙත්වා තං භික්ඛුං එතදවොච - ‘‘එත්තකොපි ඛො, භික්ඛු, අත්තභාවපටිලාභො නත්ථි නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො සස්සතිසමං තථෙව ඨස්සති. එත්තකො චෙපි, භික්ඛු, අත්තභාවපටිලාභො අභවිස්ස නිච්චො ධුවො සස්සතොඅවිපරිණාමධම්මො, නයිදං බ්‍රහ්මචරියවාසො පඤ්ඤායෙථ

සම්මා දුක්ඛක්ඛයාය. යස්මා ච ඛො, භික්ඛු, එත්තකොපි අත්තභාවපටිලාභො නත්ථි නිච්චො ධුවො සස්සතො අවිපරිණාමධම්මො, තස්මා බ්‍රහ්මචරියවාසො පඤ්ඤායති සම්මා දුක්ඛක්ඛයාය.

‘‘භූතපුබ්බාහං, භික්ඛු, රාජා අහොසිං ඛත්තියො මුද්ධාවසිත්තො. තස්ස මය්හං, භික්ඛු, රඤ්ඤො සතො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස චතුරාසීතිනගරසහස්සානි අහෙසුං කුසාවතී රාජධානිප්පමුඛානි. තස්ස මය්හං, භික්ඛු, රඤ්ඤො සතො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස චතුරාසීතිපාසාදසහස්සානි අහෙසුං ධම්මපාසාදප්පමුඛානි. තස්ස මය්හං, භික්ඛු, රඤ්ඤො සතො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස චතුරාසීතිකූටාගාරසහස්සානි අහෙසුං මහාබ්‍යූහකූටාගාරප්පමුඛානි (මහාවියූහකූටාගාරප්පමුඛානි (දී. නි. 2.263)). තස්ස මය්හං, භික්ඛු, රඤ්ඤො සතො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස චතුරාසීතිපල්ලඞ්කසහස්සානි අහෙසුං දන්තමයානි සාරමයානි සොවණ්ණමයානි ගොණකත්ථතානි පටිකත්ථතානි පටලිකත්ථතානි කදලිමිගපවරපච්චත්ථරණානි (කාදලිමිගපවරපච්චත්ථරණානි (සී.))සඋත්තරච්ඡදානි උභතොලොහිතකූපධානානි. තස්ස මය්හං, භික්ඛු, රඤ්ඤො සතො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස චතුරාසීතිනාගසහස්සානි අහෙසුං සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණද්ධජානි හෙමජාලපටිච්ඡන්නානි උපොසථනාගරාජප්පමුඛානි. තස්ස මය්හං, භික්ඛු, රඤ්ඤො සතො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස චතුරාසීතිඅස්සසහස්සානි අහෙසුං සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණද්ධජානි හෙමජාලපටිච්ඡන්නානි වලාහකඅස්සරාජප්පමුඛානි. තස්ස මය්හං, භික්ඛු, රඤ්ඤො සතො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස චතුරාසීතිරථසහස්සානි අහෙසුං සොවණ්ණාලඞ්කාරානි සොවණ්ණද්ධජානි හෙමජාලපටිච්ඡන්නානි වෙජයන්තරථප්පමුඛානි. තස්ස මය්හං, භික්ඛු, රඤ්ඤො සතො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස චතුරාසීතිමණිසහස්සානි අහෙසුං මණිරතනප්පමුඛානි. තස්ස මය්හං, භික්ඛු…පෙ…. චතුරාසීතිඉත්ථිසහස්සානි අහෙසුං සුභද්දාදෙවිප්පමුඛානි. තස්ස මය්හං, භික්ඛු…පෙ…. චතුරාසීතිඛත්තියසහස්සානි අහෙසුං අනුයන්තානි පරිණායකරතනප්පමුඛානි. තස්ස මය්හං, භික්ඛු…පෙ…. චතුරාසීතිධෙනුසහස්සානි අහෙසුං දුකූලසන්දනානි කංසූපධාරණානි. තස්ස මය්හං, භික්ඛු…පෙ…. චතුරාසීතිවත්ථකොටිසහස්සානි අහෙසුං ඛොමසුඛුමානි කොසෙය්‍යසුඛුමානි කම්බලසුඛුමානි කප්පාසිකසුඛුමානි. තස්ස මය්හං, භික්ඛු…පෙ…. චතුරාසීතිථාලිපාකසහස්සානි අහෙසුං; සායං පාතං භත්තාභිහාරො අභිහරියිත්ථ.

‘‘තෙසං ඛො පන, භික්ඛු, චතුරාසීතියා නගරසහස්සානං එකඤ්ඤෙව තං නගරං හොති යමහං තෙන සමයෙන අජ්ඣාවසාමි - කුසාවතී රාජධානී. තෙසං ඛො පන, භික්ඛු, චතුරාසීතියා පාසාදසහස්සානංඑකොයෙව සො පාසාදො හොති යමහං තෙන සමයෙන අජ්ඣාවසාමි - ධම්මො පාසාදො. තෙසං ඛො පන, භික්ඛු, චතුරාසීතියා කූටාගාරසහස්සානං එකඤ්ඤෙව තං කූටාගාරං හොති යමහං තෙන සමයෙන අජ්ඣාවසාමි - මහාබ්‍යූහං කූටාගාරං. තෙසං ඛො පන, භික්ඛු, චතුරාසීතියා පල්ලඞ්කසහස්සානං එකොයෙව සො පල්ලඞ්කො හොති යමහං තෙන සමයෙන පරිභුඤ්ජාමි - දන්තමයො වා සාරමයො වා සොවණ්ණමයො වා රූපියමයො වා. තෙසං ඛො පන, භික්ඛු, චතුරාසීතියා නාගසහස්සානං එකොයෙව සො නාගො හොති යමහං තෙන සමයෙන අභිරූහාමි - උපොසථො නාගරාජා. තෙසං ඛො පන, භික්ඛු, චතුරාසීතියා අස්සසහස්සානං එකොයෙව සො අස්සො හොති යමහං තෙන සමයෙන අභිරූහාමි - වලාහකො අස්සරාජා. තෙසං ඛො පන, භික්ඛු, චතුරාසීතියා රථසහස්සානං එකොයෙව සො රථො හොති යමහං තෙන සමයෙන අභිරූහාමි - වෙජයන්තො රථො. තෙසං ඛො පන, භික්ඛු, චතුරාසීතියා ඉත්ථිසහස්සානං එකායෙව සා ඉත්ථී හොති යා මං තෙන සමයෙන පච්චුපට්ඨාති - ඛත්තියානී වා වෙලාමිකා වා. තෙසං ඛො පන, භික්ඛු, චතුරාසීතියා වත්ථකොටිසහස්සානං එකඤ්ඤෙව තං වත්ථයුගං හොති යමහං තෙන සමයෙන පරිදහාමි - ඛොමසුඛුමං වා කොසෙය්‍යසුඛුමං වා කම්බලසුඛුමං වා කප්පාසිකසුඛුමං වා. තෙසං ඛො පන, භික්ඛු, චතුරාසීතියා ථාලිපාකසහස්සානං එකොයෙව සො ථාලිපාකො හොති යතො නාළිකොදනපරමං භුඤ්ජාමි තදුපියඤ්ච සූපෙය්‍යං(සූපබ්‍යඤ්ජනං (ස්‍යා. කං.)). ඉති ඛො, භික්ඛු, සබ්බෙ තෙ සඞ්ඛාරා අතීතා නිරුද්ධා විපරිණතා. එවං අනිච්චා ඛො, භික්ඛු, සඞ්ඛාරා. එවං අද්ධුවා ඛො, භික්ඛු, සඞ්ඛාරා. එවං අනස්සාසිකා ඛො, භික්ඛු, සඞ්ඛාරා. යාවඤ්චිදං , භික්ඛු, අලමෙව සබ්බසඞ්ඛාරෙසු නිබ්බින්දිතුං, අලං විරජ්ජිතුං, අලං විමුච්චිතු’’න්ති. චතුත්ථං.

4. ගොමය සූත්‍රය

ගොමය පිණ්ඩූපම සුත්තං >සංයුත්තනිකායොඛන්ධකවග්ගො> ඛන්ධසංයුත්තං> මජ්ඣිමපණ්ණාසකො> පුප්ඵවග්ගො

96

මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවනලද ජේතවනාරාමයෙහි වාසය කරන සේක. ඉක්බිති භික්ෂුවක් තෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙකද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පැත්තෙක හුන්නේය. එක් පැත්තෙක හුන්නාවූ, ඒ භික්ෂුතෙම භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ කීයේය.

“ස්වාමීනි, නිත්‍යවූ, ස්ථිරවූ, සියලු කල්හි පවතින්නාවූ, නොපෙරලෙන ස්වභාව ඇත්තාවූ, සදාකාලිකයන් හා සමානව එසේම සිටින්නාවූ යම්කිසි රූපයෙක් ඇත්තේද?”

“ස්වාමීනි, නිත්‍යවූ, ස්ථිරවූ, සියලු කල්හි පවත්නාවූ නොපෙරලෙන ස්වභාව ඇත්තාවූ සදාකාලිකයන් මෙන් එසේම සිටින්නාවූ යම්කිසි වේදනාවක් ඇත්තේද?

“ස්වාමීනි, නිත්‍යවූ ස්ථිරවූ, හැමදා පවතින්නාවූ නොපෙරෙලෙන ස්වභාවය ඇත්තාවූ සදාකාලික වස්තුවක්සේ එසේම සිටින්නාවූ යම්කිසි සංඥාවක් ඇත්තේද?

“ස්වාමීනි, නිත්‍යවන්නාවූ ස්ථිරවන්නාවූ, හැම කල්හි පවත්නාවූ, නොපෙරෙලෙන ස්වභාවය ඇත්තාවූ සදාකාලික වස්තුවක් මෙන් එසේම සිටින්නාවූ යම්කිසි සංස්කාරයෝ ඇත්තාහුද?

“ස්වාමීනි නිත්‍යවූ ස්ථිරවූ, හැමකල්හි පවතින්නාවූ නොපෙරෙලෙන ස්වභාවය ඇත්තාවූ හැමකල්හි පවත්නාවූ දෙයක් මෙන් එසේම තිබෙන්නාවූ යම් කිසි විඥානයෙක් ඇත්තේද?”

“මහණ, නිත්‍යවූ, ස්ථිරවූ, හැම කල්හි පවත්නාවූ නොපෙරෙලෙන ස්වභාවය ඇත්තාවූ සදාකාලික වස්තුවක් සේ එසේම සිටින්නාවූ කිසි රූපයෙක් නැත්තේමය.

“මහණ, නිත්‍යවූ, ස්ථිරවූ, හැමදා පවතින්නාවූ නොපෙරෙලෙන ස්වභාවය ඇත්තාවූ, සදාකාලික වස්තුවක් මෙන් එසේම සිටින්නාවූ කිසි වේදනාවක් තොමෝ නැත්තේමය.

“මහණ, නිත්‍යවූ, ස්ථිරවූ, හැම කල්හි පවතින්නාවූ නො පෙරෙලෙන ස්වභාවය ඇත්තාවූ සදාකාලික වස්තුවක් මෙන් එපරිද්දෙන්ම සිටින්නාවූ කිසි සංඥාවක් නැත්තේමය.

“මහණ, නිත්‍යවූ ස්ථිරවූ හැමකල්හි පවත්නාවූ නො පෙරෙලෙන ස්වභාවය ඇත්තාවූ, සදාකාලික වස්තුවක් මෙන් එකාකාරව සිටින්නාවූ කිසි සංස්කාර කෙනෙක් නැත්තාහුමය.

මහණ නිත්‍යවූ, ස්ථිරවූ, හැමදා පවතින්නාවූ නොපෙරෙලෙන ස්වභාවය ඇත්තාවූ, සදාකාලික දෙයක් මෙන් එසේම සිටින්නාවූ කිසි විඥානයෙක් නැත්තේමය.”

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ස්වල්පවූ ගොම පිඩක් අතින් ගෙන ඒ මහණහට මෙය වදාළසේක.

“මහණ, නිත්‍යවූ ස්ථිරවූ හැමකල්හි පවත්නාවූ නොපෙරෙලෙන ස්වභාවය ඇත්තාවූ මෙපමණවූද ඉපදීම ලැබූ ආත්මභාවයක් නැත.

“මහණ, නිත්‍යවූ, ස්ථිරවූ, හැම කල්හි පවත්නාවූ, නොපෙරෙලෙන ස්වභාවය ඇත්තාවූ, මෙපමණවූද ආත්මභාවය ලැබීමක් ඉදින් වන්නේ නම් මනාව දුක් ක්ෂය කරනු පිණිස මේ මාර්ගබ්‍රහ්මචර්යාව විසීම නම් නොපණවන්නේය.

“මහණ, යම්හෙයකින් නිත්‍යවූ, ස්ථිරවූ, හැමකල්හි පවත්නාවූ, නොපෙරෙලෙන ස්වභාවය ඇත්තාවූද, මේ (ගොම පිඩ) පමණවූද, ආත්මභාව ප්‍රතිලාභයෙක් නැද්ද, එහෙයින් මනා කොට දුක් ක්ෂය කරනු පිණිස මාර්ගබ්‍රහ්මචර්යාව විසීම පණවන්නේය.

“මහණ, මම පෙර හිසෙහි ඔටුනු පළඳවන ලද්දාවූ ක්ෂත්‍රිය රජෙක් වීමි.

“මහණ, හිසෙහි ඔටුනු පළඳවන ලද්දාවූ ක්ෂත්‍රිය රජවූම ඒ මට කුසාවතී රාජධානිය ප්‍රධානකොට ඇති අසූහාර දහසක් නුවරවල් වූහ.

“මහණ, හිසෙහි ඔටුනු පළඳවන ලද්දාවූ ක්ෂත්‍රිය රජවූම ඒ මට ධර්මප්‍රාසාදය ප්‍රධාන කොට ඇති අසූහාරදහසක් ප්‍රාසාදයෝ වූහ. මහණ, හිසෙහි ඔටුනු පළඳවන ලද්දාවූ ක්ෂත්‍රිය රජවූම ඒ මට ‘මහාබ්‍යූහ’ නම් කුළුගෙය ප්‍රධානකොට ඇති අසූ හතර දහසක් කුළුගෙවල් වූහ.

“මහණ, හිසෙහි ඔටුනු පළඳවන ලද්දාවූ ක්‍ෂත්‍රිය රජවූම ඒ මට (ඇත්) දනිත් කරන ලද්දාවූද, රත්හඳුන් අරටුවෙන් කරන ලද්දාවූද, රනින් කරන ලද්දාවූද, රිදියෙන් කරන ලද්දාවූද, අඟල් හතරකට වැඩි ලොම් ඇති කළුකොඳු පලස් අතුරණ ලද්දාවූද, දෙපැත්තෙහි සුදු එළු ලොම් මුවා කම්බිලි අතුරණ ලද්දාවූද, ගණවූ මල් ඇති සුදු එළු ලොම් මුවා ඇතිරිලි අතුරණ ලද්දාවූද, කෙසෙල් මුවන්ගේ සමින් කරන ලද උතුම් පසතුරුණු අතුරණ ලද්දාවූද, මත්තෙහි බඳින ලද රතුවියන් සහිතවූ දෙපැත්තෙහි තබන ලද රතු කොට්ට ඇත්තාවූ අසූහාරදහසක් පුටුවූහ.

“මහණ, හිසෙහි ඔටුණු පළඳන ලද්දාවූ ක්ෂත්‍රිය රජවූම ඒ මට ස්වර්ණාභරණ ඇති, රනින් කරන ලද කොඩි ඇති රන්දැලින් වසන ලද්දාවූ, උපෝසථ හස්තිරාජයා ප්‍රධාන කොට ඇති සුවාසූ දහසක් ඇත්තුවූහ.

“මහණ, හිසෙහි ඔටුණු පළඳන ලද්දාවූ, ක්ෂත්‍රිය රජවූම ඒ මට ස්වර්ණාලංකාර ඇත්තාවූ, රන් දද ඇත්තාවූ, රන් දැලින් වසන ලද්දාවූ, වලාහක අශ්වරාජයා ප්‍රධානකොට ඇති අසූහතර දහසක් අශ්වයෝ වූහ.

“මහණ, හිසෙහි ඔටුණු පළඳන ලද්දාවූ, ක්ෂත්‍රිය රජවූම ඒමට ස්වර්ණාලංකාර ඇති රනින් කරන ලද කොඩි ඇති රන් දැලින් වසන ලද්දාවූ, වෛජයන්ත රථය ප්‍රධානකොට ඇති අසූහාරදහසක් රථ වූහ.

“මහණ, හිසෙහි ඔටුණු පළඳවන ලද්දාවූ, ක්ෂත්‍රිය රජවූම ඒ මට අසූහාරදහසක් මැණික් වූහ.

“මහණ, හිසෙහි ඔටුණු පළඳන ලද්දාවූ, ක්ෂත්‍රිය රජවූම ඒ මට ශුභද්‍රාදේවිය ප්‍රධානකොට ඇති අසූහාරදහසක් ස්ත්‍රීහු වූහ.

“මහණ, හිසෙහි ඔටුණු පළඳන ලද්දාවූ ක්ෂත්‍රිය රජවූම ඒ මට අනුකූලවූ පුත්‍ර රත්නය ප්‍රධාන කොට ඇති අසූහාර දහසක් ක්ෂත්‍රියයෝ වූහ.

“මහණ, හිසෙහි ඔටුණු පළඳන ලද්දාවූ, ක්ෂත්‍රිය රජවූම ඒ මට රෙදි අතුරන ලද්දාවූ, රිදීයෙන් කරන ලද කිරිදෝනා බඳුන් ඇති සුවාසූ දහසක් දෙන්නු වූහ.

“මහණ, හිසෙහි ඔටුණු පළඳවන ලද්දාවූ, ක්ෂත්‍රිය රජවූම ඒ මට කොමු පිළියෙන් සියුම්වූද, කෝසෙයා්‍ය වස්ත්‍රයෙන් සියුම්වූද, පලස්වලින් සියුම්වූද, කපු පිළියෙන් සියුම්වූද අසූ හතර දහසක් රෙදි මිටිවූහ.

“මහණ, හිසෙහි ඔටුණු පළඳවන ලද්දාවූ ක්ෂත්‍රිය රජවූම ඒ මට අසූහතර දහසක් බත් හැළි වූහ. සවසද උදෑසනද දිය යුතු ඒ බත දෙන ලදී.

“මහණ, මම එකල්හි යම් නුවරෙක වෙසෙම්ද, ඒ සුවාසූ දහසක් නගරයන් අතුරෙන් කුසාවතී රාජධානියවූ ඒ එකම නුවර වෙයි.

“මහණ ඒ අසූහතර දහසක් ප්‍රාසාදයන් අතුරෙන් යම් පහයෙක මම එකල්හිවසම්ද, ධර්මප්‍රාසාදයවූ ඒ එකම ප්‍රාසාදය වෙයි.

“මහණ, මම එකල්හි යම් කුළුගෙයක වසම්ද, ඒ සුවාසූ දහසක් කුළුගෙවල් අතුරෙන් “මහාබ්‍යුහ” කුළුගෙයවූ ඒ එකම කුළුගෙය වෙයි.

“මහණ, මම එසමයෙහි යම් පුටුවක් පරිභොගකරම්ද, ඒ අසූහතර දහසක් පුටු අතුරෙන් ඇත් දතින් කරන ලද්දාවූ හෝ රත්හඳුන් හරින් කරන ලද්දාවූ හෝ රනින් කරන ලද්දාවූ හෝ රිදීයෙන් කරන ලද්දාවූ හෝ ඒ එකම පුටුවක් වෙයි.

“මහණ, මම ඒ කාලයෙහි යම් ඇත් රජෙකු පිට නගිම්ද, ඒ සුවාසූ දහසක් ඇතුන් අතුරෙන් උපොසිත හස්තිරාජයාවූ ඒ එකම ඇතෙක් වෙයි.

“මහණ, මම ඒ කාලයෙහි යම් අසෙකු පිට නගිම්ද, ඒ අසූහතර දහසක් අසුන් අතුරෙන් වලාහක අශ්වරාජයාවූ ඒ එකම අශ්වයෙක් වෙයි.

“මහණ මම ඒ කාලයෙහි යම් රියකට නගිම්ද, ඒ අසූ හතර දහසක් රථයන් අතුරෙන් විජයොත් රිය නම් වූ ඒ එකම රථය වෙයි.

“මහණ, මම එසමයෙහි ක්ෂත්‍රිය ස්ත්‍රියක හෝ ක්ෂත්‍රියයාට දාව බැමිණිය කුස උපන්නාවූද, බමුණාට දාව ක්ෂත්‍රිය ස්ත්‍රිය කුස උපන්නාවූද ස්ත්‍රියක් උපස්ථාන කෙරේද, ඒ සුවාසූ දහසක් ස්ත්‍රීන් අතුරෙන් ඈ එකම ස්ත්‍රී (රත්නය) වෙයි.

“මහණ එසමයෙහි යම් පිළි සඟළක් හඳිම්ද, ඒ අසූහතර දහසක් වස්ත්‍ර මිටි අතුරෙන් කොමු පිළියෙන් සියුම්වූද, කොසෙයා්‍ය වස්ත්‍රයෙන් සියුම්වූද කම්බිලියෙන් සියුම්වූද, කපුපිළියෙන් සියුම්වූද, ඒ එකම පිළිසඟළෙක් වෙයි.

“මහණ, මම එසමයෙහි යම් සහල් නැළියක පමණ බත් ද ඊට සුදුසු සූප ව්‍යඤ්ජනද අනුභව කරම්ද, ඒ අසූහතරදහසක් පිසූ බත් සැළි අතුරෙන් ඒ එකම සැළියක පිසූ බත වෙයි.

“මහණ, මෙසේ වනාහි ඉක්මගියාවූ ඒ හැම සංස්කාරයෝ නිරුද්ධවූහ, පෙරළුණාහුය. මහණ, මෙසේ සංස්කාරයෝ අනිත්‍ය වන්නාහුමය. මහණ, මෙසේ සංස්කාරයෝ ස්ථිර නොවන්නාහුමය. මහණ, මෙසේ සංස්කාරයෝ සැනසිලි නැත්තාහුමය. මහණ, සියලු සංස්කාරයන්හි අතිශයින් කලකිරෙන්නට සුදුසුමය, නො ඇලෙන්නට සුදුසුමය. මිදෙන්නට සුදුසුමය.”

(හතරවෙනි ගොමය සූත්‍රය නිමි.)

3. සීහසුත්තං

සීහසුත්තං> අඞ්ගුත්තරනිකායො> චතුක්කනිපාතො> පඨමො පණ්ණාසකො> චක්කවග්ගො

33

‘‘සීහො , භික්ඛවෙ, මිගරාජා සායන්හසමයං ආසයා නික්ඛමති. ආසයා නික්ඛමිත්වා විජම්භති. විජම්භිත්වා සමන්තා චතුද්දිසා අනුවිලොකෙති. සමන්තා චතුද්දිසා අනුවිලොකෙත්වා තික්ඛත්තුං සීහනාදං නදති. තික්ඛත්තුං සීහනාදං නදිත්වා ගොචරාය පක්කමති. යෙ ඛො පන තෙ, භික්ඛවෙ, තිරච්ඡානගතා පාණා සීහස්ස මිගරඤ්ඤො නදතො සද්දං සුණන්ති, තෙ යෙභුය්‍යෙන භයං සංවෙගං සන්තාසං ආපජ්ජන්ති. බිලං බිලාසයා පවිසන්ති, දකං දකාසයා (උදකං උදකාසයා (ක.) සං. නි. 3.78; පටි. ම. අට්ඨ. 1.1.37 පස්සිතබ්බං) පවිසන්ති, වනං වනාසයා පවිසන්ති, ආකාසං පක්ඛිනො භජන්ති . යෙපි තෙ, භික්ඛවෙ, රඤ්ඤො නාගා ගාමනිගමරාජධානීසු දළ්හෙහි වරත්තෙහි බන්ධනෙහි බද්ධා, තෙපි තානි බන්ධනානි සඤ්ඡින්දිත්වා සම්පදාලෙත්වා භීතා මුත්තකරීසං චජමානා යෙන වා තෙන වා පලායන්ති. එවං මහිද්ධිකො ඛො, භික්ඛවෙ, සීහො මිගරාජා තිරච්ඡානගතානං පාණානං, එවං මහෙසක්ඛො එවං මහානුභාවො.

‘‘එවමෙවං ඛො, භික්ඛවෙ, යදා තථාගතො ලොකෙ උප්පජ්ජති අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා, සො ධම්මං දෙසෙති - ‘ඉති සක්කායො, ඉති සක්කායසමුදයො, ඉති සක්කායනිරොධො(සක්කායස්ස අත්ථඞ්ගමො (අට්ඨ., සං. නි. 3.78) ‘‘සක්කායනිරොධගාමිනී’’ති පච්ඡිමපදං පන පස්සිතබ්බං), ඉති සක්කායනිරොධගාමිනී පටිපදා’ති. යෙපි තෙ, භික්ඛවෙ, දෙවා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා උච්චෙසු විමානෙසු චිරට්ඨිතිකා, තෙපි තථාගතස්ස ධම්මදෙසනං සුත්වා

යෙභුය්‍යෙන භයං සංවෙගං සන්තාසං ආපජ්ජන්ති - 'අනිච්චා වත කිර, භො, මයං සමානා නිච්චම්හාති අමඤ්ඤිම්හ; අද්ධුවා වත කිර, භො, මයං සමානා ධුවම්හාති අමඤ්ඤිම්හ; අසස්සතා වත කිර, භො, මයං සමානා සස්සතම්හාති අමඤ්ඤිම්හ. මයං කිර, භො, අනිච්චා අද්ධුවා අසස්සතා සක්කායපරියාපන්නා'ති. එවං මහිද්ධිකො ඛො, භික්ඛවෙ, තථාගතො සදෙවකස්ස ලොකස්ස, එවං මහෙසක්ඛො එවං මහානුභාවො''ති.

''යදා බුද්ධො අභිඤ්ඤාය, ධම්මචක්කං පවත්තයී;
සදෙවකස්ස ලොකස්ස, සත්ථා අප්පටිපුග්ගලො.

''සක්කායඤ්ච නිරොධඤ්ච, සක්කායස්ස ච සම්භවං;
අරියඤ්චට්ඨඞ්ගිකං මග්ගං, දුක්ඛූපසමගාමිනං.

''යෙපි දීඝායුකා දෙවා, වණ්ණවන්තො යසස්සිනො;
භීතා සන්තාසමාපාදුං, සීහස්සෙවි'තරෙමිගා.

''අවීතිවත්තා සක්කායං, අනිච්චා කිර භො මයං;
සුත්වා අරහතො වාක්‍යං, විප්පමුත්තස්ස තාදිනො''ති (සං. නි. 3.78). තතියං;

3. සීහොපම සූත්‍රය

සීහසුත්තං> අඞ්ගුත්තරනිකායො> චතුක්කනිපාතො> පඨමො පණ්ණාසකො> චක්කවග්ගො

33

''මහණෙනි, මෘගරාජවූ සිංහ තෙම සවස් වේලාවෙහි ගුහාවෙන් නික්මෙයි. ගුහාවෙන් නික්ම කෙසරු සලා ඇඟ සොලවයි. කෙසරු සලා හාත්පස සතර දිශාව බලයි. හාත්පස සතර දිශාව බලා, තුන්වරක් සිංහනාද කරයි. තුන්වරක් සිංහනාද කොට ගොදුරු පිණිස නික්මෙයි. මහණෙනි, යම් ඒ තිරිසන්ගත ප්‍රාණීහු නාද කරන්නාවූ, මෘගරාජවූ සිංහයාගේ ශබ්දය අසත්ද, ඔවුහු බොහෝ සෙයින් භයට, සංවේගයට, තැතිගැන්මට පැමිණෙත්. ගුල්වල වාසය කරන්නාහු, ගුලට ප්‍රවිෂ්ට වෙත්. ජලයෙහි වාසය කරන්නාහු, ජලයට ප්‍රවිෂ්ට වෙත්. වනයෙහි වාසය කරන්නාහු, වනයට ප්‍රවිෂ්ට වෙත්. පක්ෂීහු ආකාශයට යත්.

''මහණෙනි, ගම්, නියම්ගම්, රාජධානීන්හි තද වරපට බන්ධනයෙන් බඳින ලද රජුගේ ඇත්තු වෙද්ද, ඔවුහුද ඒ බන්ධන සිඳ බිඳ, බිය වූවාහු, මළ මූත්‍ර කරමින්, යම් ඒ තැනක පලායත්. මහණෙනි, තිරිසන්ගත සතුන් අතරින් සිංහවූ මෘග රාජයා මෙසේ මහත් ඍද්ධි ඇත්තේය. මෙසේ මහෙසාක්‍ය වන්නේය. මෙසේ මහානුභාව ඇත්තේය.

''මහණෙනි, එසේම යම් කලෙක්හි අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ, අෂ්ටවිද්‍යා, පසළොස්චරණ ධර්මයන්ගෙන් යුක්තවූ, සුගතවූ, ලොකය දත්, නිරුත්තර පුරුෂධම්ම සාරථීවූ, දෙවි මිනිසුන්ගේ ශාස්තෘවූ, බුද්ධවූ, භාග්‍යවත්වූ තථාගතයන් වහන්සේ ලෝකයෙහි උපදී. හෙතෙමේ මේ සක්කාය නම් පඤ්චඋපාදානස්කන්ධයෝය. මේ සක්කාය සමුදය නම් පඤ්චඋපාදානස්කන්ධයට හේතුවයි. මේ සක්කාය නිරෝධයය. මේ සක්කාය නිරෝධගාමිණී ප්‍රතිපදාවයයි ධර්මය වදාරයි.

''මහණෙනි, දීර්ඝායුෂ්කවූ, වර්ණවත්වූ, සැප බහුලකොට ඇත්තාවූ, උස්වූ විමානවල බොහෝකල් සිටින්නාවූ, යම් දේවතා කෙනෙක් ඇද්ද, ඔවුහුද තථාගතයන් වහන්සේගේ ධර්මය අසා බොහෝ සෙයින්, භයට, සංවේගයට, තැතිගැන්මට පැමිණෙත්. පින්වත්නි, ඒකාන්තයෙන් අනිත්‍යවූ අපි, නිත්‍යයයි සිතුවෙමු. පින්වත්නි, ඒකාන්තයෙන් අනියතවූ අපි, නියතයයි සිතුවෙමු. පින්වත්නි, අශාස්වත අපි, ශාස්වතයයි සිතුවෙමු. අපිදු පින්වත්නි, අනිත්‍ය වෙමු, අනියත වෙමු, අශාස්වත වෙමු, පඤ්චඋපාදානස්කන්ධයට ඇතුළත් වෙමු කියායි. මහණෙනි, තථාගත තෙම, මෙසේ මහත් ඍද්ධි ඇත්තේය.. දෙවියන් සහිත ලෝකයට මෙසේ මහේශාක්‍යය. මෙසේ මහානුභාව ඇත්තේය.

''දෙවියන් සහිත ලෝකයාගේ අතිපුද්ගලවූ, ශාස්තෘවූ බුදුරජ තෙම, පඤ්චඋපාදානස්කන්ධ සංඛ්‍යාත සක්කායද, එහි නිරෝධයද, එහි හේතුවද, දුක්ඛයාගේ සංසිඳීමට පැමිණෙන මාර්ගයද, විශිෂ්ට ඥානයෙන් දැන, යම් කලෙක්හි ධර්ම චක්‍රය පැවැත්වූයේද, වර්ණවත්වූ, යසස් ඇත්තාවූ, දීර්ඝායුෂ්කවූ දෙවියෝ සෙසු මෘගයෝ සිංහයාට මෙන් කෙලෙසුන්ගෙන් මිදුනාවූ, තාදීවූ, බුදුරජානන් වහන්සේ ගේ වචනය අසා, පින්වත්නි, අපි ඒකාන්තයෙන් අනිත්‍ය වෙමු. සක්කාය නොඉක්මවූ වෙමුයි බිය වූවාහුය. තැතිගැන්මට පැමිණියාහුය.''

491
‘‘අනිච්චා අද්ධුවා කාමා, බහුදුක්ඛා මහාවිසා;
අයොගුළොව සන්තත්තො, අඝමූලා දුඛප්ඵලා.

491
“කාමයෝ එකසේ නොවෙත්. ස්ථිර නොවෙත්. බොහෝ දුක් ඇත්තාහ. මහත් විෂයහ. ගිනියම් කළ යකඩ ගුලියක් බඳුය. උවදුරු මුල්ය. දුක් ඵල දෙයි.

- නාලං.නි නො සෑහේ; ප්‍රමාණ නොවේ.
- නාලං.අ නුසුදුසු, නොසෑහෙන

1. අස්සුතවාසුත්තං

61

එවං මෙ සුතං - එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ…පෙ…. ‘‘අස්සුතවා, භික්ඛවෙ, පුථුජ්ජනො ඉමස්මිං චාතුමහාභූතිකස්මිං කායස්මිං නිබ්බින්දෙය්‍යාපි විරජ්ජෙය්‍යාපි විමුච්චෙය්‍යාපි. තං කිස්ස හෙතු? (චාතුම්මහාභූතිකස්මිං (සී. ස්‍යා. කං.))දිස්සති, භික්ඛවෙ (දිස්සති හි භික්ඛවෙ (සී. ස්‍යා. කං.)), ඉමස්ස චාතුමහාභූතිකස්ස කායස්ස ආචයොපි අපචයොපි ආදානම්පි නික්ඛෙපනම්පි. තස්මා තත්‍රාස්සුතවා පුථුජ්ජනො නිබ්බින්දෙය්‍යාපි විරජ්ජෙය්‍යාපි විමුච්චෙය්‍යාපි’’.

‘‘යඤ්ච ඛො එතං, භික්ඛවෙ, වුච්චති චිත්තං ඉතිපි, මනො ඉතිපි, විඤ්ඤාණං ඉතිපි, තත්‍රාස්සුතවා පුථුජ්ජනො නාලං නිබ්බින්දිතුං නාලං විරජ්ජිතුං නාලං විමුච්චිතුං. තං කිස්ස හෙතු? දීඝරත්තඤ්හෙතං, භික්ඛවෙ, අස්සුතවතො පුථුජ්ජනස්ස අජ්ඣොසිතං මමායිතං පරාමට්ඨං - ‘එතං මම, එසොහමස්මි, එසො මෙ අත්තා’ති. තස්මා තත්‍රාස්සුතවා පුථුජ්ජනො නාලං නිබ්බින්දිතුං නාලං විරජ්ජිතුං නාලං විමුච්චිතුං.

‘‘වරං , භික්ඛවෙ, අස්සුතවා පුථුජ්ජනො ඉමං චාතුමහාභූතිකං කායං අත්තතො උපගච්ඡෙය්‍ය, න ත්වෙව චිත්තං. තං කිස්ස හෙතු? දිස්සතායං, භික්ඛවෙ, චාතුමහාභූතිකො කායො එකම්පි වස්සං තිට්ඨමානො ද්වෙපි වස්සානි තිට්ඨමානො තීණිපි වස්සානි තිට්ඨමානො චත්තාරිපි වස්සානි තිට්ඨමානො පඤ්චපි වස්සානි තිට්ඨමානො දසපි වස්සානි තිට්ඨමානො වීසතිපි වස්සානි තිට්ඨමානො තිංසම්පි වස්සානි තිට්ඨමානො චත්තාරීසම්පි වස්සානි තිට්ඨමානො පඤ්ඤාසම්පි වස්සානි තිට්ඨමානො වස්සසතම්පි තිට්ඨමානො, භිය්‍යොපි තිට්ඨමානො.

‘‘යඤ්ච ඛො එතං, භික්ඛවෙ, වුච්චති චිත්තං ඉතිපි, මනො ඉතිපි, විඤ්ඤාණං ඉතිපි, තං රත්තියා ච දිවසස්ස ච අඤ්ඤදෙව උප්පජ්ජති අඤ්ඤං නිරුජ්ඣති. සෙය්‍යථාපි, භික්ඛවෙ, මක්කටො අරඤ්ඤෙ පවනෙ චරමානො සාඛං ගණ්හති, තං මුඤ්චිත්වා අඤ්ඤං ගණ්හති, තං මුඤ්චිත්වා අඤ්ඤං ගණ්හති; එවමෙව ඛො, භික්ඛවෙ, යමිදං වුච්චති චිත්තං ඉතිපි, මනො ඉතිපි, විඤ්ඤාණං ඉතිපි, තං රත්තියා ච දිවසස්ස ච අඤ්ඤදෙව උප්පජ්ජති අඤ්ඤං නිරුජ්ඣති.

‘‘තත්‍ර, භික්ඛවෙ, සුතවා අරියසාවකො පටිච්චසමුප්පාදංයෙව සාධුකං යොනිසො මනසි කරොති - ‘ඉති ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති; ඉමස්මිං අසති ඉදං න හොති, ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති - යදිදං අවිජ්ජාපච්චයා සඞ්ඛාරා; සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං…පෙ…. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. අවිජ්ජාය ත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො; සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො…පෙ…. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොතී’’’ති.

‘‘එවං පස්සං, භික්ඛවෙ, සුතවා අරියසාවකො රූපස්මිම්පි නිබ්බින්දති, වෙදනායපි නිබ්බින්දති, සඤ්ඤායපි නිබ්බින්දති, සඞ්ඛාරෙසුපි නිබ්බින්දති, විඤ්ඤාණස්මිම්පි නිබ්බින්දති; නිබ්බින්දං විරජ්ජති, විරාගා විමුච්චති, විමුත්තස්මිං විමුත්තමිති ඤාණං හොති. ‘ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා’ති පජානාතී’’ති. පඨමං.

7. මහා වර්ගය

1. අස්සුතවන්තු සූත්‍රය

අස්සුතවන්තුසුත්තං> සංයුත්තනිකායො>නිදානවග්ගො >අභිසමයසංයුත්තං> මහාවග්ගො

61

මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර සමීපයෙහිවූ අනේපිඬු සිටාණන් විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වාසයකරන සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ "මහණෙනි"යි කියා භික්ෂූන් ඇමතූසේක. "ස්වාමීනි"යි කියා ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්හ. (එවිට) භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

"මහණෙනි, අශ්‍රැතවත් (බොහෝ ඇසූපිරූ තැන් නැති) පෘථග්ජනතෙම සතර මහා ධාතුවෙන් ඇතිවූ, මේ කයට කලකිරෙන්නේද, නැලෙන්නේද, (එය) අත්හරිනු කැමැති වන්නේද වෙයි. ඊට හේතු කවරේද? මහණෙනි, මේ සතර මහා ධාතුවෙන් හටගත් කයේ වැඩීමද, පිරිහීමද, ඇතිවීමද, නැතිවීමද දකියි. ඒ නිසා එහිදී, අශ්‍රැතවත් පෘථග්ජන තෙම කලකිරෙන්නේද වෙයි. නැලෙන්නේද වෙයි. අත්හැරීමට කැමැති වන්නේද වෙයි. මහණෙනි, යමකට වනාහි සිතයයි කියනු ලැබේද, මනසයයි කියනු ලැබේද, විඤ්ඤාණයයි කියනු ලැබේද, අශ්‍රැතවත් පෘථග්ජන තෙමේ එහි කලකිරීමෙහි සමර්ථ නොවේ, නො ඇලීමෙහි සමර්ථ නොවේ. මිදීමෙහි සමර්ථ නොවේ. ඊට හේතු කවරේද? අශ්‍රැතවත් පෘථග්ජනයා විසින් බොහෝ කාලයක් මුළුල්ලෙහි 'ඒ සිත මගේය, මම වෙමිය, මාගේ ආත්මයයි, වැළඳගන්නා ලදී. මමායනය කරනලදී. දෘෂ්ටියෙන් අල්ලාගන්නා ලදී. එහෙයින් අශ්‍රැතවත් පෘථග්ජන තෙමේ එහි කලකිරීමට සමර්ථ නොවේ. නොඇලීමට සමර්ථ නොවේ. මිදීමට සමර්ථ නොවේ.

"මහණෙනි, අශ්‍රැතවත් පෘථග්ජනතෙම 'සිත මමයයි ගන්නවාට වඩා මේ සතර මහා ධාතුවෙන් හටගත් කය මමයයි ගැනීම හොඳය.' ඊට හේතු කවරේද? මහණෙනි, සතර මහා ධාතුවෙන් හටගත්තාවූ, අවුරුද්දක් සිටින්නාවූද, දැවුරුද්දක් සිටින්නාවූද, තුන් අවුරුද්දක් සිටින්නාවූද, සතර අවුරුද්දක් සිටින්නාවූද, පස් අවුරුද්දක් සිටින්නාවූද, දස අවුරුද්දක් සිටින්නාවූද, විසි අවුරුද්දක් සිටින්නාවූද, තිස් අවුරුද්දක් සිටින්නාවූද, හතළිස් අවුරුද්දක් සිටින්නා වූද, පනස් අවුරුද්දක් සිටින්නාවූද හැට අවුරුද්දක් සිටින්නාවූද, හැත්තෑ අවුරුද්දක් සිටින්නාවූද, අසූ අවුරුද්දක් සිටින්නාවූද, අනූ අවුරුද්දක් සිටින්නාවූද, අවුරුදු සීයක් සිටින්නාවූද, ඊට වැඩිය හෝ සිටින්නාවූද, මේ කය දක්නා ලැබේ. (එහෙයිනි.) මහණෙනි, යමකට වනාහි සිත යයි කියනු ලැබේද, මනසයයි කියනු ලැබේද, විඤ්ඤාණයයි කියනු ලැබේද ඒ සිත රෑද, දවල්ද, අනිකක්ම උපදියි අනිකක්ම නිරුද්ධ වෙයි.

"මහණෙනි, මහාවනයෙහි හැසිරෙන වඳුරා යම්සේ අත්තක් අල්ලා ගනීද, එය හැර තව අත්තක් අල්ලා ගනීද, එය හැර තව අත්තක් අල්ලා ගනීද, එය හැර තව අත්තක් අල්ලා ගනීද, මහණෙනි, එසේම මේ යමක් වනාහි සිතයයි කියනු ලැබේද, මනසයයි කියනු ලැබේද, විඤ්ඤාණයයි කියනු ලැබේද, ඒ සිත රෑද, දවල්ද, අනිකක් උපදියි, අනිකක් නිරුද්ධවෙයි.

"මහණෙනි, එහිදී ශ්‍රැතවත් (බොහෝ ඇසූපිරූතැන් ඇති) ආර්ය ශ්‍රාවකතෙම "පටිච්ච සමුප්පාදයම" මනාකොට නුවණින් කල්පනා කරයි. (කෙසේද?) මේ හේතුව ඇති කල මේ ඵලය ඇතිවෙයි. මේ හේතුවගේ පහළවීමෙන් මේ ඵලය පහළ වෙයි. මෙය නැති කල මෙය නැතිවේ. මෙය නූපන් කල්හි මෙය නූපදියි, යනුවෙනි. හේ මෙසේයි:-

"අවිජ්ජාව නිසා සංස්කාර ඇතිවේ. සංස්කාර නිසා විඤ්ඤාණය ඇතිවේ. විඤ්ඤාණය නිසා නාමරූප ඇතිවේ. නාමරූප නිසා සළායතන ඇතිවේ. සළායතන නිසා ස්පර්ශය ඇතිවේ. ස්පර්ශය නිසා වේදනාව ඇතිවේ. වේදනාව නිසා තණ්හාව ඇතිවේ. තණ්හාව නිසා උපාදානය ඇතිවේ. උපාදානය නිසා භවය ඇතිවේ. භවය නිසා (ජාතිය) ඉපදීම ඇතිවේ. ඉපදීම (ජාතිය) නිසා ජරා, මරණද, ශෝකවීම, (හැඬීම්) දුක්වීම්, දොම්නස්වීම් සහ වැළපීම් ඇතිවෙත්. මෙසේ මේ සියලු දුක් ගොඩ ඇතිවෙයි.

"අවිජ්ජාව මුළුමණින්ම නැතිකිරීමෙන් සංස්කාර නැති වෙයි. සංස්කාර නැතිවීමෙන් විඤ්ඤාණය නැති වෙයි. විඤ්ඤාණය නැතිවීමෙන් නාම රූප නැතිවෙයි. නාම රූප නැතිවීමෙන් සළායතන නැතිවෙයි. සළායතන නැතිවීමෙන් ස්පර්ශය නැතිවෙයි. ස්පර්ශය නැතිවීමෙන් වේදනාව නැති වෙයි. වේදනාව නැතිවීමෙන් තණ්හාව නැතිවෙයි. තණ්හාව නැතිවීමෙන් උපාදානය නැතිවෙයි. උපාදානය නැතිවීමෙන් භවය නැතිවෙයි. භවය නැතිවීමෙන් ජාතිය (උත්පත්තිය), නැතිවෙයි. ජාතිය (උප්පත්තිය) නැතිවීමෙන් ජරා, මරණ, ශෝක, පරිදේව, දුක්, දොම්නස් සහ උපායාසයෝ නැතිවෙත්. මෙසේ මේ සැපයෙන්ද මිශ්‍ර දුක් සමූහය නැතිවෙයි. මහණෙනි, මෙසේ දකින්නාවූ, ශ්‍රැතවත් (බොහෝ ඇසූපිරූතැන් ඇති) ආර්ය ශ්‍රාවකතෙම රූපයෙහිද කලකිරෙයි. වේදනාවෙහිද කලකිරෙයි. සංඥාවෙහිද කලකිරෙයි. සංස්කාරයෙහිද කලකිරෙයි. විඤ්ඤාණයෙහිද කලකිරෙයි. කලකිරුනේ නැලෙයි. නැලීමෙන් නිවණ ලබයි. රහත් ඵලයට පැමුණුනු කල්හි නිවණ ලැබුවේ යයි නුවණ ඇතිවෙයි. ඉපදීම අවසාන යන වූයේය. බ්‍රහ්මචරියාවෙහි හැසිර නිමවන ලද්දේය. කළයුතු දේ කළේය. මේ ආත්මයෙහි කළයුතු තවත් දෙයක් නැතැයි දැනගනියි.

(පළමුවන අස්සුතවන්තු සූත්‍රය නිමි.)